පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date 2025.04.08 පැය 0655 | දුරකථන අංකය Tel.NO 011-2887973 | මගේ අංකය My NO D/Media/Out/677/2025 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - හික්කඩුව පොලිස් ස්ථානය.**

2025.04.03 වන දින රාත්‍රී කාලයේ හික්කඩුව පොලිස් වසමේ කුමාරකන්ද ප්‍රදේශයේ මාගර්ය අසල නිමි ඇඳුම් වෙළඳසැලක් ආසන්නයේ රැඳී සිටි කාන්තාවකට හා පුද්ගලයෙකුට යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් වෙඩි තබන ලද අතර ඔවුන් දෙදෙනා බරපතල තුවාල ලබා කරාපිටිය රෝහලට ඇතුළත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී පිරිමි පුද්ගලයා මියයාමේ සිද්ධිය සම්බන්ධයෙන් හික්කඩුව පොලිසිය මගින් විමශර්න ආරම්භ කර තිබුණි.

ඒ අනුව මෙම වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු 2025.04.07 වන දින දහවල් කාලයේ හිකකඩුව පොලිස් වසමේ ගිනිමැල්ලගමහ ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 23 ක් වන ගෝනපීනුවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හික්කඩුව පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**